# අභිනිෂ්ක්‍රමණය

ඇසළ පොහොය පසු වී සති දෙකක් පමණ ගෙවී ගිය ද මේ තීරුවෙන් අභිනිෂ්ක්‍රමණය ගැන අද සාකච්ඡා කිරීම වරදක් ලෙස දකින්නකු ඇතැයි නො සිතමි. මේ මාතෘකාවෙන් ම නොවුවත් මෙවැනි ලිපියක් ලිවීමට මට සිතුණේ දැනට අවුරුදු කිහිපයකට පෙර ය. එහෙත් නොයෙකුත් හේතූන් නිසා ඒ දවසෙන් දවස කල් දැමීමට සිදුවිය. මේ දිනවල පැවැත්වෙන සාක් සම්මේලනය වැදගත් වුවත් ඒ ගැන අළුතින් ලිවීමට තරම් දෙයක් නො වේ. එබැවින් අපේ කලාපයේ පැරණි චින්තනය මත පදනම් වූ අභිනිෂ්ක්‍රමණයට මේ සතියේ ඉඩක් ලැබෙයි.

වසර කිහිපයකට පෙර එක්තරා බෞද්ධ පඬිවරයකු, එනම් බුදු දහම පිළිබඳ පඬිවරයකු, තම ප්‍රසිද්ධ දේශනයක දී කියා සිටි කරුණකින් මම මවිතයට පත්වීමි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වහළුන් වූ බොහෝ පඬිවරු බෞද්ධ සංස්කෘතියෙහි සඳහන් බොහෝ දේ කිසි වග විභාගයක් නැතිව විවේචනය කරති. එසේත් නැතහොත් බුදු දහමෙහි බටහිර විද්‍යාව සොයති. කාලාම සූත්‍රයෙහි ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයක් ඇතැයි කියන්නෝ ඇතැම් බෞද්ධ පඬිවරු පමණක් නො වෙති. මේ ඇතැමුන් කාලාම සූත්‍රය මුල සිට අගට කියවා නැති බව පැහැදිලි ය. කිසිවකු කී පමණින් නොපිළිගත යුතුය ආදී වශයෙන් කාලාමයනට දේශනා කළ බුදු රජාණන් වහන්සේ අවසානයේ දී අවවාද කර ඇත්තේ කුමක් දැයි මේ පඬිවරු නො දනිති. මේ පිළිබඳ ව වසර ගණනාවකට පෙර ලියන ලද ලිපියකින් බුදුන් වහන්සේ කාලාමයනට විඤ්ඤූන් ක්‍රියාකරන ආකාරයට ක්‍රියාකිරීමටත් විඤ්ඤූන් නොකරන දෑ නොකිරීමටත් අවවාද කර ඇති බව සඳහන් කෙළෙමි.

මෙලොව වසන කිසිවකුට තමන් විසින් ම පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් සියල්ල කළ හැකි නො වේ. පොතක පතක තිබූ පමණින් ඇසූ පමණින් ආදී වශයෙන් නොපිළිගෙන සිටියහොත් තම තමන් ම සියල්ල විභාග කර බලා කටයුතු කිරීමට මුළු ජීවිත කාලය ම මදි වනු ඇත. බුදුන් වහන්සේ කිසිවකුටවත් එසේ උපදෙස් නො දෙන බව පැහැදිලි ය. උන්වහන්සේ විඤ්ඤූන් නැතහොත් දැන උගත් අය කරන කියන දෑ කිරීමටත් ඔවුන් නොකියන නොකරන දෑ නොකිරීමටත් අවවාද කර ඇති බව දැනගත හැක්කේ කාලාම සූත්‍රය අවසානය තෙක් කියවීමෙන් පසුව ය. එහෙත් පඬිවරු කාලාම සූත්‍රයෙහි මුල් කොටස් පමණක් කියවා එතැනින් ම කියවීම අවසන් කරන්නේ පොතක පතක තිබූ පමණින් කිසිවක් නොපිළිගත යුතු යැයි කියා ඇති බැවින් යැයි නො සිතමි. ඒ එසේ නම් කාලාම සූත්‍රයෙහි තිබූ පමණින් වත් යමක් පිළිගත යුතු නො වේ. ඒ කෙසේ වෙතත් කාලාම සූත්‍රය තමන්ට රිසි සේ තේරුම් ගැනීමට අවශ්‍ය නිසා දෝ ඒ අවසාන වන තෙක් කියවීමටවත් පඬිවරුන්ට ඉවසිල්ලක් නැති සේ ය. කාලාමයනට පිළිගැනීමට තරම් විඤ්ඤූන් එකල සිටින්නට ඇත. එහෙත් අද අපට සිටින විඤ්ඤූහු කවරහු ද? බුදු දහම දන්නේ යැයි කියන ආචාර්ය මහාචාර්යවරු කී දෙනකු විඤ්ඤූන් ලෙස සැලකිය හැකි ද? බුදුන් වහන්සේ, ධර්මය හා සංඝයා වහන්සේ වෙනුවට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සරණ ගොස් ඇති මොවුහු ඊනියා තර්කණය රත්නත්‍රයෙන් එකක් ලෙස සලකති.

මා මුලින් ම සඳහන් කළ පඬිවරයා තම කතාවෙන් කියා සිටියේ තමාගේ අත්දැකීමක් ගැන ය. ඇමරිකාවේ ද කලක් වාසය කළ ඔහු ඇමරිකාවේ වාසය කරන තම මිතුරකුගේ කුඩා දරුවකු ඇසූ ප්‍රශ්නයකින් කම්පාවට පත් වී ඇත. ඒ කුඩා දරුවා අසා ඇත්තේ අවුරුදු විසි නවයක් වන තුරු ම සිදුහත් කුමරු මහල්ලකු ලෙඩකු මළ කඳක් පැවිද්දකු නොදැක සිටි බව පිළිගත හැකි ද යන්න ය. අවුරුදු විසි නවයක් ම මහල්ලකු කෙසේ වෙතත් රෝගියකු නොදැක සිටින්නේ කෙසේ ද? ශුද්ධෝදන රජු ඒ වන විට ඇතැම් විට මහළු ස්වරූපයක් නොගෙන සිටිය ද ඒ වසර විසි නවයේ ම රෝගාතුර නො වූයේ ද?

ශුද්ධෝදන රජු රෝගාතුර වූ විට සිදුහත් කුමරුගෙන් වසන් වී සිටිය ද, මාළිගාවේ අනෙක් සියළු රෝගීන් සිදුහත් කුමරුට නොපෙනෙන ලෙස සඟවා තබා තිබුණ ද, සිදුහත් කුමරු ඒ වසර විසි නවයෙහි ම රෝගී භාවයකට පත්වූයේ නැත් ද? එසේත් නැත්නම් සිදුහත් කුමරු රෝගාතුර වූ නමුත් තමන් රෝගාතුර වූ බව නොදැන සිටියේ ද? මේ කාලය ඇතුළත මාළිගාවෙහි කිසිවකු මිය ගියේ නැත් ද? ඒ මළවුන් ද සිදුහත් කුමරුන්ට නොපෙනෙන ලෙස මාළිගාවෙන් පිටමං කළ ද කලක් සිටියවුන් පසුව නොදකින විට සිදුහත් කුමරු ප්‍රශ්න නොකර සිටියේ ද? තම මව ගැන එතුමා කිසි දිනෙක ප්‍රශ්න නො කෙළේ ද? අප පඬිවරයා තම කතාවෙන් කියා සිටියේ අර කුඩා දරුවා ඉහත

© Prof. Nalin De Silva

සඳහන් ප්‍රශ්න සියල්ල ඇසූ බව නො වේ. පඬිවරයා කියා සිටියේ ඒ කුඩා දරුවා අසන තෙක් ඒ ප්‍රශ්න ඇසීමට තමා ද ඇතුළු පඬිවරුන් ද, පඬිවරුන් නොවූ වැඩිහිටියන් ද අසමත් වී ඇති බව ය. ඒ කුඩා දරුවාට අඩුම තරමින් රාජ්‍ය සම්මානයක්වත් නොදිය යුතු ද? එසේත් නැතහොත් රාජ්‍ය නොවන සම්මානයක්, විකල්ප සම්මානයක් නොදිය යුතු ද? අඩුම තරමින් එක් පඬිවරයකුගේ ඇස් ඇරීමට සමත් වූ කුඩා දරුවා ඔස්සේ අපේ පඬිවරයා අපේ ඇස්වලට වැලි ගසයි.

මහල්ලකු ලෙඩකු ආදී වශයෙන් දැකීම පිළිබඳ කතාව මුලින් ම සඳහන් වන්නේ කිනම් පොතක දැයි කීමට මම නො දනිමි. බොහෝ විට ඒ මහායාන පොතක වීමට ඇති ඉඩකඩ වැඩි ය. සතර පෙර නිමිති දැකීම, සිදුහත් කුමරු තම ගෞතම ගෝත්‍රයෙහි ම කුමරියක වූ කිශාගෝතමියගෙන් නිබ්බුත පද ඇසීම, තිරය කඩුවෙන් මෑත්කර රාහුල පුතා බලා නොබලා ඡන්න ඇමති සමග මාලිගාවෙන් පිටවීම, කන්ථක අසු පිටින් නේරංජනාවෙන් එතෙර වීම, තවුස් වෙස් ගැනීම, කන්ථක අසු මිය යෑම, ඡන්න ඇමති අඬ අඬා ආපසු මාළිගාවට යෑම නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කළ හැකි ය. අර කුඩා දරුවා ඒ ඇසළ පොහෝ දින නේරංජනාවේ වතුර කොපමණ තිබිණි ද, නේරංජනාව යනු ගඟක් ද දිය කඩිත්තක් ද යනුවෙන් ඇසුවේ දැයි ඒ පඬිවරයාගෙන් ම අසා දැනගත යුතු ය.

වැඩිහිටියන්ගේ කතා අසා නින්දට යන කුඩා දරුවන්ගේ කතාවලින් වැඩිහිටියන් ඇස් ඇරීම ඇස් පියාගෙන සිටීමට වඩා හොඳ ය. එහෙත් අපේ ඇස්වලට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඇඟිලිවලින් වැලි ගැසීමට ඉඩ දිය හැකි නො වේ. අභිනිෂ්ක්‍රමණ කතාවලින් කියැවෙන්නේ කුමක් ද? අභිනිෂ්ක්‍රමණය යනු සෙල්ලමක් හෝ නාට්‍යයක් හෝ නො වෙයි. බුද්ධත්වය අවබෝධ කරගැනීමේ මුල් පියවර එය විය. දෙවැනි පියවර දුෂ්කරක්‍රියාව අත්හැරීම විය. තුන්වැන්න බුද්ධගයාවට පිටත්වීම ය. ඒ මුල් පියවර කුඩා දරුවකුගේ ඊනියා තාර්කික ඥානයකට වැටහේ යැයි අප පඬිවරයා සිතන්නේ ද? සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය තාර්කික ඥානය ද අභිනිෂ්ක්‍රමණය කිරීමක් විය. තර්ක කිරීමෙන් (එනම් ද්විකෝටික න්‍යායෙන් තර්ක කිරීමෙන්) බුද්ධත්වයට පත්වීමට තබා හරි හමන් ගණිත ගැටළුවක්වත් (පැය දෙකේ තුනේ විභාගවලට දෙන බොහෝ කසිකබල් ගණිත ගැටළු නොවේ) විසඳාගත නො හැකි ය!

සිදුහත් කුමරු මාළිගාවෙහි රෝගීන් දකින්නට ඇත. මහල්ලන් දකින්නට ඇත. මළවුන් දකින්නට ඇත. මාළිගාවෙන් පිටත පැවිද්දන් දකින්නට ඇත. නිවුණු පුද්ගලයන් ගැන කලින් අසන්නට ඇත. එහෙත් ඒ ඇසූ සෑම වාරයක් පාසාම තම ගෙළ පැළඳි මාලය ගෞතමියකට තෑගි නොකරන්නට ඇත. නාට්‍යාංගනාවන් දකින්නට ඇත. වෙනත් පියකු මෙන් රාහුල පුතුගේ පැමිණීම බලාපොරොත්තුවන්නට ඇත. යශෝධරා දේවිය සමග ඒ පිළිබඳ සිහින මවන්නට ඇත. නේරංජනාවේ එහාට මෙහාට යන්නට ඇත. එහෙත් ඒ ඇසළ මාසයෙහි එතුමා ඒ සියල්ල වෙනස් ආකාරයකට දැක්කේ ය. ඒ තර්ක ඥානයෙන් දැකීමක් නො වීය. එදා එතුමා දුටුවේ අප සියළු දෙනාම දකින ස්ථිතික මහල්ලකු නො වේ. මහල්ලකු දුටු පමණින් නොව මහල්ලකු වීමෙන් පසුවත් අපි අභිනිෂ්ක්‍රමණය නො කරමු. එදා එතුමා මහළුවීම, ජරාවට පත්වීම, එනම් දිරායෑම, තරුණ බවේ සිට මහළුවීම, වෙනස්වීම ආදිය පසුබිම් කරගත් ගතික මහල්ලා දකින්නට ඇත. මේ අනිත්‍ය අවබෝධ කරගැනීමේ පළමු පියවර වී යැයි සිතමි. එතුමා එදා රෝගියා ද වෙනස් ආකාරයකට දකින්නට ඇත. එය ද ජරාව අනිත්‍ය හා දුක සමග එකට දකින්නට ඇත. එදා එතුමා නාට්‍යාංගනාවන් දකින්ට ඇත්තේ ජරාවට පත්වූ රෝගීන් ලෙස යැයි සිතමි. මරණයෙන් මේ සියල්ල කෙළවර නොවන බව එතුමාට අවබෝධ වන්නට ඇත. මරණය පමණක් නොව ජරාව ද (ජරා මරණ) නැති කළ හැක්කේ ඉපදීම (ජාති) නැතිකිරීමෙන් බවත් නිවිය හැක්කේ ජාති ජරා මරණ දුක නැති කිරීමෙන් බවත් අවබෝධ වන්නට ඇත. පැවිද්ද, එනම් (සාක්)කලාපීය ශ්‍රමණ සම්ප්‍රදාය ඒ සඳහා යානය බවත් එතුමාට අවබෝධවන්නට ඇත. රාහුල කුමරා බලා නොබලා නොගෙස්, බලා යෑමට කල්පනා කෙළේ නම් කුමක් සිදුවන්නට තිබුණේ ද? අර අවබෝධ සියල්ල නැවතත් කණපිට පෙරළෙන්නට තිබුණි. අපට අපේ පුතුන් රාහුලයන් සේ නො පෙනයි. වෙනදා නේරංජනාවෙන් එතෙර මෙතෙර ගිය කුමරා එදා ආපසු මෙතෙර නොඑන්නට එතෙර ගියේ ය. සතර පෙර නිමිති පෙර නිමිති වන්නේ බුද්ධත්වයට බව කුඩා දරුවාට නො වැටහෙයි. කුඩා දරුවා මහල්ලකු රෝගියකු දකින්නේ සාමාන්‍ය අර්ථයෙන් මිස පෙර නිමිති අර්ථයෙන් නොවේ. සිදුහත් කුමරු එදා දුටුවේ මහල්ලන් ලෙඩුන් නො වේ. සිදුහත් කුමරු මහල්ලන් ලෙඩුන් මළ කඳන්, පැවිද්දන් මාළිගාවේත් පිටත් කලින් දකින්නට ඇත. එහෙත් සතර පෙර නිමිති නොදකින්ට ඇත. එදා එතුමා දැක්කේ ඒ පෙර නිමිති ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva